(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(10).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 මාර්තු මස 01 වැනි සිකුරාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 174/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා
ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා
ගරු අනෝමා ගමගේ මහත්මිය
ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

බාල වයස්කාර ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක වූ රිසානා නෆීක් ඇය කිසිසේත් වගකිව යුතු නොවූ අපරාධයක් සම්බන්ධයෙන් ලැබූ විනිශ්චයකින් පසු මරණීය දණ්ඩනයට යටත් කරන ලද බව මේ වනවිට සියලු දෙනා දන්නා කරුණක් වන හෙයින්ද;

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මහතාගේ විෂය පථය යටතේ එන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුළුමනින්ම රිසානා නෆීක් හට කිසිදු ආකාරයක අර්ථාන්විත සහයක් ලබාදීමට අපොහොසත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇයට අකාලයේ අවාසනාවන්ත ලෙස මිය යාමට සිදු වූ බව සියලු දෙනා දන්නා කරුණක් වන හෙයින්ද;

අමාත්‍යවරයා මෙම කරුණ මුළුමනින්ම සාවද්‍ය ලෙස කළමනාකරණය කරමින්, මෙහි දෝෂය සැබෑ ලෙසම එතුමා විසින් ඍජුවම දැරිය යුතු අවස්ථාවක හුදෙක් සෞදි අරාබි රජයට දොස් පැවරීමේ නිරර්ථක වෑයමක යෙදෙමින් ප්‍රකාශ නිකුත් කිරීමට පමණක් සීමා වී සිටි බව පැහැදිලි කරුණක් වන හෙයින්ද;

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මහතාට තවදුරටත් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.